# වෙනුර ගේ කැල්කියුලේටරය

තාත්තා ගේ බැණුමෙන් ද, ටොකුවලින් ද, කණ මිරිකීමෙන් ද බේරී සිටීමේ පරම පවිත්‍ර චේතනාව පමණක් සිතැතිව තුනේ පන්තියේ දී මම චක්කරය කට පාඩම් කරගැනීමට ඉමහත් වෙහෙසක් ගත්තෙමි. අප සැම දන්නා පරිදි අවසානයේ උත්සාහවන්තයා ජය ගන්නේය. ඒ ජයග්‍රාහී උත්සාහයේ එක් අතුරු ඵලයක් වූයේ දෙවන වාර විභාගයේ ගණිතය සඳහා මා ඉතා ඉහල ලකුණු සංඛ්‍යාවක් ලබා ගැනීමයි.

එය චක්කරය නොදැන සිටීම නිසා මට හෙලන්නට සිදුවූ කඳුළු බිඳුවලට ලැබුණු වන්දියක් මෙන් විය.

චක්කරය වනාහී ඇත්තෙන්ම චක්කරයකි! එය මගේ පියාට ද පෙර දිනක වද දෙන්නට ඇත. නැවත කැරකී විත් දශක ගණනාවකට පසු මට ද වද දුන්නේය. නැවතත් කැරකී විත් දශක ගණනාවකට පසු මගේ පුතා ට ද පසුගිය වසරේ දී වද දුන්නේය. මගේ මුණුබුරන්ට ද එලෙස වද දීමට තව දශක කීපයකින් අප හමුවට එනු ඇත. චක්කරය යන නම සැදී ඇත්තේ මේ චක්‍රාකාර ක්‍රියාවලිය නිසා දෝ හෝ යි මට අද සිතේ.

එද තුනේ පන්තියේ කුඩා කොළු ගැටයෙකු ලෙස චක්කරය හා ගැටෙමින් සිටියදී මා නොදැන සිටි එක් කරුණක් නම් වියලි කෝෂ වලින් පණ ගැන්වී විදුලි පන්දම් මෙන් එලිය විහිදුවන තිරයකින් ද, බේක්ලයිට් වැසුමකින් ද, ඒ අස්සෙන් එබෙන ඉලක්කම් සහ ගණිත සංකේතයෙන් සැරසුණු බොත්තම් රාශියකින් ද සමන්විත වූ,

***<u>කැල්කියුලේටරයක් ගැනීම යනු මගේ අනාගත සැලසුම්වල ක්ෂිතිජ ඉසව්වේ හෝ නොතිබුණු දෙයක් විය. හිරවී සිටි කොට කලිසමෙන් බැහැරව දිග කලිසම් භාවිතා කිරීමට පටන් ගැනීම වැන්නක් නම් කැල්කියුලේටරයක් ගැනීමට වඩා එකල මගේ දැවෙන අවශ්‍යතාවක් විය.</u>***

චක්කරය ද චක්කරය මත පදනම් වූ වෙනත් ගණිත මිණීතයන්ද ක්ෂණයකින් වමාරන්නට හැකියාවක් තිබූ, ගණක යන්ත්‍රය නොහොත් කැල්කියුලේටරය නම් විශ්වකර්ම උපකරණයක්, ලංකාවේ කෙසේ වෙතත්, සමහර රටවල අධ්‍යාපන කටයුතු වලදී ද, ගණකාධිකාරී කටයුතු වලදී ද එවකට භාවිතයේ තිබුණු බවයි.

මා මුලින්ම කැල්කියුලේටරයක් දුටුවේ කවද දැයි මට සිහිපත් කර ගත නොහැකි ය. ඒත් මගේම කියා කැල්කියුලේටරයක් හිමිකර ගත හැකි වූයේ නම් එද තුන්වන ශ්‍රේණියේ දී චක්කරය සමතික්‍රමණය කළ කාලයෙන් වසර දහයකටත් පසුවය.
ඒත් අප අතර සිටි සමහර පාසැල් සිසුවෝ ඊට වඩා වරප්‍රසාද ලද්දෝ වූහ. ඔව්හූ කැල්කියුලේටර මැජික් මට වඩා වසර දෙක තුනකට කලින්ම අත්දුටුවෝය.

උසස් ජාතික සහතිකය සඳහා විද්‍යා ධාරාවේ බැස ඉගෙන ගත්තද, දහවන ශ්‍රේණියේ දී අප හැදෑරුවේ ජීව විද්‍යාව, ගණිතය, සිංහල වැනි පොදු විෂයයන් විය. එකොලොස්වන වසර සඳහා පන්ති බෙදීමේදී ඒ වන විට අප කැමැත්ත ප්‍රකාශ කර තිබුණු ජීව විද්‍යා සහ ගණිතය ධාරාවන්ට අප යොමුකරන ලදී. මෙහිදී මා ගණිතය ධාරාව හා එක් වෙද්දී මා සමග එකට වසරක් පමණ කාලයක් උගෙනුම ලැබූ වෙනුර නම් මිතුරා ජීව විද්‍යා ධාරාව සමග පීනා ගියේය.
දැන් පන්ති දෙකක ඉගෙනුම ලැබුවද පෙර මෙන් ම නිරතුරු නොවුනත් තවමත් අප දිනපතාම වාගේ හමුවෙන නිසා අපේ මිත්‍රත්වය පෙරසේම පැවතුණි.

දිනක් මා දුටු වෙනුර මා අසලට පැමිණියේ මුව නගා ගත් අමුතුම ආකාරයේ සිනාවකුත් සමගය.

“මචං උඹ මැත්ස් නේද කරන්නේ?”
ඔහු විමසීය.

“ඔව්” මා පිළිතුරු දුන්නේ සැකයකින් යුතුවය. මා ගණිතය හදාරණ බව වෙනුර සක් සුදක් සේ දනී.

“ඉතිං උඹ ගන්නෙ නැද්ද කැල්කියුලේටර් එකක්?” ඔහුගේ ඊලඟ පැණය එය විය.

වෙනුර ගේ මුවේ රැඳි ගුප්ත මන්දස්මිතය දැන් හොඳට කැපී පෙනේ.

මේ 1978 වසරයි. කැල්කියුලේටර අද මෙන් පොදු පරිහරණයේ නොතිබිණි. එමෙන්ම අප උසස් පෙල සඳහා ඉගෙන ගනිමින් සිටි, අවකලනය, අනුකලනය, සාපේක්ෂ ප්‍රවේගය, දෛශික ආදී විෂයය කොටස් සඳහා කැල්කියුලේටර යනු වැඩි ප්‍රයෝජනයක් නොමැති දෙයකි. ඒ සමගම උසස් පෙල විභාගය සඳහා කැල්කියුලේටර භාවිතයට ඉඩ නොදෙන බැවින්, එවැනි උපකරණ පාවිච්චි කර පාඩම් වැඩ කිරීමද අනවශ්‍ය මෙන්ම විභාගයේ දී අහිතකර ලෙස බල පෑමටද ඉඩ තිබුණි.

මෙනිසා, කැල්කියුලේටරයක් ගැනීම යනු මගේ අනාගත සැලසුම්වල ක්ෂිතිජ ඉසව්වේ හෝ නොතිබුණු දෙයක් විය. හිරවී සිටි කොට කලිසමෙන් බැහැරව දිග කලිසම් භාවිතා කිරීමට පටන් ගැනීම වැන්නක් නම් කැල්කියුලේටරයක් ගැනීමට වඩා එකල මගේ දැවෙන අවශ්‍යතාවක් විය.

මේ මුළු විස්තරය මම වෙනුර සමග පවසන්නට නොගියෙමි. “මොන කැල්කියුලේටර් ද බං?” වැනි වදන් පෙලක් මගේ මුවගින් පිට වෙන්නට ඇත.

වෙනුරගේ ගුප්ත මද සිනහව උපහාසාත්මක එකක් බවට හැරිණි.

“මොනවද බං, මැත්ස් කරල වැඩක් තියෙනවද කැල්ක් එකක් නැතුව? මට නං ලඟදීම එකක් එවනවා ඇමෙරිකාවෙ ඉන්න අපේ අයියා!” වෙනුර කීවේ මා පුදුමයටත්, සන්තාපයටත්, විනෝදයටත් එක්වර පත්කරමිනි.

මා පුදුම වූයේ මේ අනිවාර්යයෙන්ම “නයා ඇරීම-ක්” ලෙස සැලකිය හැකි ඒ ප්‍රකාශය කරන්නේ මා එතෙක් කල් නිරහංකාර පුද්ගලයෙක් යැයි සිතා සිටි වෙනුර වීම නිසාය.

මා සන්තාපයට පත්වූයේ ඔහු එසේ කිරීම, විශේෂයෙන්ම මා සමග මෙලෙස “උඹට වැඩිය මං ලොක්කෙක්!” වර්ගයේ පුරාජේරුකමක් දෙසාබෑම, නිසා මා සිත තුල හටගත් කැළඹීම සහ “එහෙනම් මා සොක්කෙක් නොවේ දෝ?” යනුවෙන් මා සිත තුල හටගත් හීනමානය නිසාය.

මා මෙහිදී විනෝදයට පත්වූවා යැයි මා පවසන්-




න් මේ සියළු අවගාමී සිතුවිලි අතරින් ම මට සිනා ගිය නිසාය. එය “කිව හිනාවක්” වශයෙන් හැඳින්විය හැකි සරදම් සිනාවක් යැයි මම සිතමි. එද පමණක් නොව ඉන් පසු වසර ගණනාවක් තිස්සේ මා මුවට නැගුනේ ද, මේ ලියන අද මා මුවට නැගෙන්නේ ද සරදම මුසු සිනාවකි.

ටික දිනක් ගතවිය. එක් සැඳෑවක මම ටියුෂන් කඩයකින් නික්ම නිවෙස බලා දුම්රියෙන් එමින් සිටියෙමි. මා සමග එද සිටියේ එදිනම මා හඳුණාගත් ජීව විද්‍යාව හදාරණ සිසුවෙක් වන ජයන්ත ය. ඔහු වෙනුර ගේ මිතුරෙක් විය.

පාසැල, ටියුෂන් පොල, විෂයය නිර්දේශ යනාදී නොයෙකුත් මාතෘකා මැද්දේ අපේ කතාව වෙනුර දෙසට යොමුවිය.

“වෙනුරයා හරිම මුවලින්දයා!” මම ජයන්තට කීවෙමි.
එතනින් නොනැවතී කැල්කියුලේටරය පිළිබඳ කතාව ද මුළුමණින්ම ජයන්තට කීවෙමි.

අඳුරේ ඇදෙන දුම්රියේ ගොරහැඩි නාදය මැද මට අමතකව ගිය සත්‍යය නම්, මා ජයන්තව හඳුනාගත්තේ එදිනම බවත්, ජයන්ත වෙනුර ගේ හොඳම මිතුරෙකු බවත් ය.

සතියකට පසුව මා පෙර කී ටියුෂන් කඩයේ තපිමින් සිට එලැඹුනු ඉසුඹුවේ දී අසල තිබූ කරාමයකට කට අල්ලා මලකඩ වතුර ටිකකින් සප්පායම් වී, ඒ පන්සල් පුන්‍යභූමියේ කොනකට වී එක්තරා අනිමිසලෝචනයක යෙදෙමින් සිටියෙමි. මගේ චිත්තසමාපත්ති බිඳිමින් සහායට තවෙකෙක් ද සමග එහි ලඟාවූයේ වෙනුර ය.

“අඩෝ උඹ හිතුවෙ මට බෑ කියල ද කැල්ක් එකක් ගන්න. උඹ දැන ගනිං, මේ දැන් මගේ සාක්කුවේ ඒක තියෙනවා!” වෙනුර තම කළුපැහැති යම් කිසි උපකරණයක කොනක් සිය කලිසම් සාක්කුවෙන් එලියට ගෙන මට පෙන්නා නැවත එහි රුවා ගත්තේය.

මා කුමක් කියන්නද? මම නිරුත්තරව සිටියෙමි. වෙනුර සිය සගයා ද සමග එතනින් යන්නට ගියේය. අද ගැටවරයන් ට නම් ජංගම දුරකතන, එම්.පී.ත්‍රී. වාදක යන්ත්‍ර යනාදී ඉලෙක්ට්‍රෝනික උපකරණ කිසිදු සුවිශේෂිත්වයක් නැති එදිනෙද සරල උපකරණ වේ. එසේ නමුත් එද, 1978 දී, සිය ලොකු අයියා විසින් ඇමරිකාවේ සිට එවනු ලැබූ මැජික් කැල්කියුලේටරයක්, වයස දසයක ගැටවරයෙකු පමණක් නොව දැනුමැති වැඩිහිටියෙකු වුවද අතිශය අමන්දනන්දයට පත් කිරීමට හේතු වීම පුදුමයක් නොවේ.

මම එද වෙනුර පිලිබඳව කහටක් ඇතිකර නොගත්තෙමි. ඇත්ත වශයෙන්ම අපි ඉතා හොඳ මිතුරන් වීමු.

වෙනුර ඔහු තෝරාගත් මගේ දුර ගමණක් ගියේය. එහිදී ඔහුට කැල්කියුලේටර් උවමනා වූයේ යැයි මම නොසිතමි. මම මගේ මගේ හැකි දුරක් ගියෙමි. ඒ අතර මගදී නම් කැල්කියුලේටර මා සමග එක්විය.

මා මිතුරු වෙනුර අද නම් සැබෑවටම කැල්කියුලේටරයක් භාවිතා කරණු ඇතැයි මට සිතේ. ඒ කොළඹට නුදුරුව පිහිටුවා ඇති ඔහු ගේ තෙමහල් පෞද්ගලික රෝහලේ ලාභ ගණන් බැලීමටය.

**The Bishops College Past Pupils Association**

The Bishops College Past Pupils Association is holding a “Friend Raising BBQ” on the

**28th of March 2010.**

The BBQ will be held from 12pm to 3pm at Burden Park, Springvale (cnr of Heatherton and Springvale Road). BYO meat /drinks. Salads and Ice-cream will be provided. All Bishopians and their families are welcome.

Please contact
**Achini on 98071154, Sirini on 0430 349 849 or Linda on 95479750**




**SRI LANKAN DENTISTS**

Dr. Tusitha Muthuhetti BDSc
Dr. Anne Perera BDSc

**KEILOR DENTAL GROUP**

**PH. 9336 2062**

49 MILLEARA ROAD,
KEILOR EAST,
VICTORIA 3033